සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

පළමුවන වාර පරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය
First Term Test - 2018 | Grade 11

සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය I | කාලය පැය 1
Communication & Media Studies I | One hour

**සැලකිය යුතුයි.-**

1. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
11. අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා ලියන්න.
111. සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් ආකාරයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
1v. පිළිතුරු පත්‍රය පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01) පුද්ගලාන්තර සන්නිවේදනය සඳහා වර්තමානයේ දී බහුලව ම භාවිතා වන සන්නිවේදන උපකරණයකි.
1) පරිගණකය 2) පේජරය
3) ජංගම දුරකථනය 4) ෆැක්ස් යන්ත්‍රය

02) ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල පුවත්පත වන්නේ ,
1) සරසවි සඳරැසයි. 2) ලංකාලෝකයයි.
3) ඥනාර්ථ ප්‍රදීපයයි 4) ලක්මිණි පහනයි.

03) තාක්ෂණික හා ගණිතමය පදනමක් සහිතව සන්නිවේදන ආකෘතියේ නිර්මාණය කරන ලද්දේ,
1) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ය. 2) විල්බර් ශ්‍රාම්ය
3) ඩේවිඩ් කේ බර්ලෝ ය. 4) ෂැනොන් හා වීවර්ය.

04) ලැස්වෙල්ගේ සන්නිවේදන නිර්වචනයේ නොදැක්වෙන සන්නිවේදන මූලිකාංගය ,
1) බාධකයයි. 2) ග්‍රාහකය යි.
3) මාධ්‍යයයි. 4) සන්නිවේදකයා යි.

05) යෝජනා පෙට්ටි පවත්වාගෙන යෑම ,
1) ඉහළ සිට පහළට කෙරෙන විධිමත් සන්නිවේදනයකි.
2) පහළ සිට ඉහළට කෙරෙන විධිමත් සන්නිවේදනයකි.
3) ඉහළ සිට පහළට කෙරෙන අවිධිමත් සන්නිවේදනයකි.
4) පහළසිට ඉහළට කෙරෙන අවිධිමත් සන්නිවේදනයකි.

06 ජාති, ආගම්, කුල, ගෝත්‍ර බෙදීම්වලින් තොරව සමාජ සහජීවනය පවත්වාගෙන යාමේ වැදගත්කම සාකච්ඡා කරන සන්නිවේදන කාර්යය වන්නේ ,
1) සංස්කෘතික ප්‍රගමනයයි. 2) සමාජනුයෝජනයයි.
2) සමාජ ඒකාබද්ධතාවයි. 4) සහජීවනයි.

07) අවාචික සන්නිවේදනයේ දී භෞතික පරිසරය ද සන්නිවේදන අර්ථ ජනනය කරයි. පරතරය පිළිබද සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) දුදරුවන් ,මාපියන් ,සැමියා, බිරිඳ ,සහෘද අවකාශයට අයත් වේ.
2) පරතරය පුද්ගල සබඳතා පිළිබඳ අර්ථ ප්‍රකාශ නොකරයි.
3) බස් රථයක ගමන් කරන පිරිස අතර අවකාශය කෘත්‍රිම එකකි.
4) යහළුවන් ,ඥාතීන් ,සන්නිවේදයේ යෙදෙන්නේ පෞද්ගලික පරතරයේ සිටය.

08) 11 ශ්‍රේණිය දරුවන් වෙනුවෙන් පැවැත්වෙන ධනාත්මකචින්තන වැඩසටහනකට සවන් දෙන 5 ශ්‍රේණියේ දරුවාට දේශකයාගේ භාෂා විලාශය ග්‍රහණය කර ගත නොහැකි විය .එය

1) මාධ්‍ය බාධාවකි. 2) භාෂාමය බාධාවකි.
3) ශ්‍රව්‍ය සංකේත බාධාවකි 4) අර්ථ බාධාවකි.

09)ප්‍රවෘත්තියක් වීමට නම් එය මෑත කාලීන වැදගත් සිදුවීමකට අදාළ අලුත් තොරතුරක් විය යුතු බව ප්‍රකාශ කලේ,

1) පොල් ඩී මැසෙනියර්ය. 2)මිල්ටන් බුෂ් ය.
3) චාර්ල්ස් ඇන්ඩර්සන් ඩානා ය. 4) එඩ්වඩ් හාපර් ය.

10) ප්‍රදීපාගාර උපක්‍රමය භාවිතා වන්නේ,

1) ජන සන්නිවේදනයේදීය. 2)සම්ප්‍රදායික සන්නිවේදනයේදී ය.
3) සමූහ සන්නිවේදනයේදී ය. 4) පුද්ගලාන්තර සන්නිවේදනයේදී ය.

11) පුවත්පත් වර්ගීකරණය සිදු කළ හැකි ප්‍රභේදයක් නොවන්නේ ,

1) ප්‍රමාණය 2) පළ වන වාරය.
3) මුද්‍රණ කඩදාසි වර්ගය 4) භාවිතා කරන පාඨකයා.

12) පෝල් ඩී.මැසෙනියර්ගේ සමීකරණය අනුව ප්‍රවෘත්තියක විශ්වාසනීයත්වය ගොඩනැගිම සඳහා බලපාන කාරණා නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න ,

1) නිවැරදි බව , සමතුලිතබව ,සුහදබව
2) නිවැරදි බව සමතුලිතබව පැහැදිලිබව
3) නිවැරදි බව, පැහැදිලිබව, නිරවුල්බව
4) නිවැරදි බව, සමතුලිතබව, නිරවුල්බව

13) ටැබ්ලොයිඩ් පුවත්පතකට නිදසුනක් නොවන්නේ,

1) සුබසෙත හා මිහිර 2) විජය හා විදුසර
3) බුදුසරණ හා සුබසෙත 4) විදුසර හා සිළුමිණ

14) දෘඪ පුවත් යනුවෙන් හදුන්වනු ලබන්නේ,

1) වැඩි දෙනෙනකුගේ අවධානයට ලක්වන ප්‍රවෘත්තිය.
2) විශාල පිරිසකට බලපෑමක් ඇති කළ හැකි ප්‍රවෘත්තිය.
3)සමාජයේ ආකර්ෂනය දිනා ගන්නා ප්‍රවෘත්තිය.
4) මානව හැඟීම්වලට ආමන්ත්‍රණය කරන ප්‍රවෘත්තිය.

15) පරිගණකයේ රූප තැන්පතු ගොනු ගබඩා කරන ආකෘතියක් නොවන පිළිතුර තෝරන්න.

1)P-Point 2) JPEG
3) EPS 4)PSD

16) ෂැනොන් හා වීවර්ට අනුව,

සන්නිවේදන බාධක වර්ග දෙක වන්නේ,

1) අර්ථ බාධක හා පාරිසරික බාධක
2) මාධ්‍ය බාධක හා පාරිසරික බාධක
3) මාධ්‍ය බාධක හා භූගෝලීය බාධක
4) අර්ථ බාධක හා මාධ්‍ය බාධක

17 ) ඵලදායී ලේඛනයක ලක්ෂණයක් නොවන වරණය තෝරන්න

1) ගැලපෙන ආකෘතියක් අනුව ලේඛනය සකස් කිරීම.
2) සම්මත ව්‍යාකරණ විධි භාවිතා කිරීම
3) A 4 ප්‍රමාණයේ කොළයක මුද්‍රණය කර තිබීම.
4) නිරවුල් බව හා පැහැදිලිබව තිබීම

18) එක් අයෙකු කේන්ද්‍ර කර ගෙන බොහෝ දෙනාට සංදේශ පැතිර යන්නේ ,

1) චක්‍රීය ආකෘතියේදී ය.
2) රෝද ආකෘතියේදී ය.
3) දාම ආකෘතියේදී ය.
4) සම්භාවිතා ආකෘතියේදී ය.

19) පාසල් කලා උළෙල වෙනුවෙන් මුද්‍රණය කරන සඟරාවේ පිටු සැකසීම සඳහා යොදා ගත හැකි පරිගණක මෘදුකාංගයකි

1) මයි ක්‍රොසොප්ට් පවර්පොයින්ට්
2) ඇඩෝබි පේජ්මේකර්
3) මයික්‍රොසොප්ට් එක්ස්සෙල්
4) මයික්‍රොසොප්ට් ඇක්සස්

20) රජයට පවරා ගත් කොටස් හිමි ගුවන්විදුලි ආයතනයකි

1) සිරස FM නාලිකාව
2) රංගිරි ශ්‍රී ලංකා නාලිකාව
3) ලක්හඬ නාලිකාව
4) සියතFM නාලිකාව

21) ශ්‍රී ලංකාවේ ජාත්‍යාන්තර සම්මත පොත් අංකය ( ISBN) ලබදෙන ආයතනය වනුයේ ,

1) ජාතික පුස්තකාලය හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යි.
2) ජාතික පුවත්පත් මණ්ඩලය යි.
3) ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය යි.
4) ශ්‍රී ලංකා මුද්‍රණ හා නීතිගත දෙපාර්තමේන්තුව යි.

22) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) කැමරා කාචයක ක්‍රියාකාරිත්වයට සමාන වේ.
2) පෙර සුදානම් කර නොගත් ලේඛන ප්‍රක්ෂේපණය කළ හැකිය.
3) රූප විශාලනය කර ප්‍රදර්ශණය කළ හැකිය.
4) ස්ලයිඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වයට සමාන වේ.

23) ලෝකයේ වෙනත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද ප්‍රථමයෙන් ස්ථාපිත වූ ජනමාධ්‍ය වන්නේ

1) ගුවන්විදුලිය යි.
2) පුවත්පත යි.
3) රූපවාහිනිය යි.
4) සිනමාව යි.

24) යුනෙස්කෝවේ අර්ථකථනයට අනුව පොතක් වීමට නම් තිබිය යුතු අවම පිටු ප්‍රමාණය ,

1) 48 කි
2) 59 කි
3)49 කි
4) 41 කි


25) ප්‍රවෘත්ති වාර්තාකරණයේදී අනුගමනය කරන රීතියකි

1) යටිකරු පිරමීඩ ආකෘතිය
2) සරල පිරමීඩ ආකෘතිය
3) උඩුකුරු පිරමීඩ ආකෘතිය
4) තිරස් පිරමීඩ ආකෘතිය

26) වෙළෙඳ දැන්වීම් මගින් සිදුවන ප්‍රධාන සන්නිවේදන කාර්යය වන්නේ ,

1) තොරතුරු සම්පාදනය යි
2) පෙළඹවීම යි
3) විනෝදාස්වාදනය යි.
4) මතවාදී කාර්යය යි.

ප්‍රශ්න අංක 27 සිට 30 දක්වා ප්‍රශ්නවලටපහත රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




27) ඉහත රූප සටහනේ 'A' අක්ෂරයෙන් දැක්වෙන්නේ ,

1) සන්නිවේදකයා යි.
2) ආකේතකරණය යි.
3) විකේතකරණය යි
4) තොරතුරු මූලාශ්‍රය යි.

28) ඉහත ආකෘතිය ඉදිරිපත් කළේ ,

1)ඔසීගුඩ් හා ශ්‍රාම් විසිනි
2) හැරල්ඩ් ඩී. ලැස්වෙල් විසිනි
3) ෂැනොන් හා වීවර් විසිනි
4) ඩේවිඩ් කේ. බර්ලෝ විසිනි

29) 'Eඅක්ෂරයෙන් දැක්වෙන්නේ ,

1) ඝෝෂාව යි
2) තොරතුරු මූලය යි.
3) භාෂාම ය ගැටලු යි
4) යාන්ත්‍රික ගැටලු යි.

30) ඉහත රූප සටහනට අනුව සංදේශය දැක්වෙන්නේ ,

1)Q හා R අක්ෂරවලිනි
2)P හා S අක්ෂරවලිනි
3)P හා R අක්ෂරවලිනි
4)Q හා S අක්ෂරවලිනි

31) කැමරාවක අනිවාර්යයෙන් ම පිහිටන කොටස් තුනකි.

1) කැමරා කාචය, කාච විවරය, මතක කාඩ් ය
2) කාච විවරය, කැමරා කාචය ,සේයා පටලය
3) කාච විවරය, ද්වාරය ,කැමරා කාචය
4) ද්වාරය ,කැමරා කාචය ,සේයා පටලය

32)"ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම" පිහිටුවනු ලැබුයේ ,

1) මිනිසාගේ හිමිකම් පිළිබඳ සොයා බැලීමටය
2) මිනිසා අන් අයට පීඩාකාරිව සිදුකරන දෑ සොයා බැලිමටය.
3) සමාජ සහජීවනය ආරක්ෂා කිරීමට ය.
4) රජයේ නිලධාරීන් අතින් සිදු වන මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරිමට යි.

33) ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි සේවා සඳහා තරංග මාලා ලබාදීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබන්නේ,

1)ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවයි.

2) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම යි.

3) ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයයි.

4) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවයි.

34) විද්‍යුත් පුවත්පතක ලක්ෂණයක් නොවන්නේ ,

1) ක්ෂණිකව පුවත් දැන ගැනීමේ හැකියාව

2) යාවත්කාලීන කිරීමේ වැඩි පහසුව

3) ගබඩාකර තබා ගැනීමේ අපහසුවයි

4) නැවත නැවත කියවීමේ හැකියාව

35) තොරතුරු රැස්කිරිම සඳහා භාවිතා කරන මූලාශ්‍රයන් නොවන්නේ,

1) සමාජ මූලාශ්‍ර

2) ආයතනික මූලාශ්‍ර

3) මාධ්‍ය මූලාශ්‍ර

4) පුද්ගල මූලාශ්‍ර

36) සන්නිවේදන වර්ගීකරණයේ පදනම වන්නේ ,

1) සන්නිවේදනය සිදුවන ස්වරූපයය නැතහොත් ආකාරයයි

2) සන්නිවේදනයට පදනම් වන තාක්ෂණික ස්වභාවයයි

3) සන්නවේදන ක්‍රියාවලියට සම්බන්ධ වන පුද්ගල සංඛ්‍යාවයි

4) සන්නිවේදනයට පාදක කර ගන්නා අරමුණ යි.

37) විධිමත් සන්නිවේදන ආකෘතියක් නොවන්නේ,

1) දාම ආකෘතයි යි.

2) පර්ෂද ආකෘතිය යි.

3) රෝද ආකෘතිය යි

4) චක්‍රිය ආකෘතිය යි

38) වෙබ් අඩවියකට උදාහරණයකි

1) www.moe.gov

2) www.gov.k

3) w.w.w.nie.lk

4)www.edupub.gov.lk

39)CCTV යන කෙටි යෙදුමෙහි පූර්ණ අදහස වන්නේ

1) සංවෘත පරිපථ කැමරා යන්නයි.

2) සංවෘත පරිපථ දුර දැකීම යන්නයි.

3) සංවෘත පරිපථ රූපවාහිනි කැමරා යන්නයි

4) සංවෘත කැමරා පද්ධති භාවිතය යන්නයි

40) නිශ්චල ඡායාරූපයක් ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු පියවර අනුපිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න

1)මානනය ,නාභිගත කිරීම ,අනාවරණය

2) නාභිගත කිරීම , මානනන ,අනාවරණය

3)මානනය ,අනාවරණය,නාභිගත කිරීම

4)) නාභිගත කිරීම ,අනාවරණය,මානනය